## බප/ජය. සමුද්‍රදේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
## පළමු වාර පරීක්ෂණය - 2012
## සිංහල භාෂාව හා සාහිත්‍යය - I කොටස

11 ශ්‍රේණිය........ | ල. ..............

නම/විභාග අංකය: ........................................................................ කාලය : පැය 01 යි.

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

* අංක 1 සිට 5 තෙක් ඇති එක් එක් වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය ඇති පාඨය තෝරන්න.

(01) ගමේ යහපත සඳහා කරන ලද සියලු යෝජනා හමස් පෙට්ටියට දමා ඇත.
(1) ආරක්ෂා කර (2) ක්‍රියාත්මක නොකොට
(3) පරිහානියට (4) රැකවරණයට

(02) අල්ලා ගනු ලැබූ හොරාට කිට්ටු කළ සමහරුන් නම් අත්වල හිරි ඇරගත්තා යැයි කියනවා මට ඇසිණි.
(1) රිසි ලෙස පහර දුන්නා (2) වද හිංසා කළා
(3) අත පය කැඩුවා (4) අත් බැඳ තැබුවා

(03) තට්ටු කරන්නාට දොර ඇරේ යන කියමන අපට හුරු පුරුදු එකකි.
(1) තට්ටු කරන විට දොර ඇරිය යුතුය (2) උත්සාහ කළොත් ජය ලැබිය හැකිය.
(3) කම්මැලියා පිරිහීමට පත් වන්නේය. (4) ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කළ යුතු නොවේ.

(04) එදා බොහෝ බලාපොරොත්තු ඇතිව පටන් ගත් සමිතියෙ වැඩ කටයුතු අවසන් වූයේ. කුඩ මිටි හරවා ගැනීමකිනි.
(1) කුඩය අතට ගැනීමෙනි (2) වැස්ස පටන් ගැනීමෙනි
(3) බහින් බස් වී කලහ කිරීමෙනි. (4) තර්ක විතර්ක කිරීමෙනි.

(05) ආත්මාර්ථකාමියා තම අදහස මුදුන් පත් කර ගැනීම සඳහා කවරෙකු වුවත් දඩමීමා කර ගැනීමට පසුබට නොවේ.
(1) මෝඩ කර ගැනීමට
(2) මුළා කිරීමට
(3) අදහස ඉටුකර ගැනීම සඳහා ප්‍රයෝජනයට ගැනීමට
(4) දඩයම් කිරීමට

* අංක 06 සිට 9 තෙක් ඇති එක් එක් වාක්‍යයේ හිස්තැනට වඩාත් සුදුසු වචනය තෝරන්න.

(06) සීගිරිය පැරණි සිංහලයින්ගේ කාර්මික .................................. උසස් බවට සිහිවටනයකි.
(1) දියුණුවේ (2) නෛපුණ්‍යයේ (3) ක්‍රියාවලියේ (4) හැකියාවේ

(07) අනුරාධපුරය අවුරුදු 1500 ක් පමණ කාලයක් .................................. පිරුණු අපේ විජය භූමිය ලෙස පැවතුණි.
(1) ඓශ්චර්යයෙන් (2) වීර වික්‍රමාන්විත (3) අනූනත්වයෙන්
(4) වත් පොහොසත් කමින්

(08) සියලු දෙනාම දේශීය භාණ්ඩ .................................. පුරුදු වුවහොත් විදේශ විනිමය ඉතිරි කර ගැනීම අපහසු නොවේ.
(1) පරිමාණයට (2) පරිහරණයට (3) නිර්මාණයට (4) නිරාමිශයට

(09) නාට්‍ය සංදර්ශනය සාර්ථක කර ගැනීම සඳහා ගම් වැසියන් දක්වූ .................................. ප්‍රශංසාර්හය
(1) අභියෝගය (2) උද්වේගය (3) අභිධානය (4) උද්යෝගය

* අංක 10 සිට 12 තෙක් එක් එක් වාක්‍යයේ හිස්තැනට ව්‍යාකරණානුකූලව වඩාත් සුදුසු පදය තෝරන්න.

(10) .................................. සොබා දහම අලංකාර කරතියි සාහිත්‍යකාමීහු පවසති.
(1) ගංගා (2) ගංගාවෝ (3) නදීහු (4) ගංගාවන්

(11) භාරතයට නිදහස දිනා ගැනීම සඳහා අවිහිංසාවාදීව සටන් කළ ගාන්ධිතුමා ශ්‍රේෂ්ඨ .................................. .
(1) නායකයකු විය (2) නායකයෙක් වූහ (3) නායකයෙක් විය (4) නායකයකු වූය

(12) ක්‍රීඩා උත්සවය අවසානයේ .................................. තම නිවෙස් බලා පා නැගූහ.
(1) ළමයි සියල්ලන්ම (2) ළමයින් සියල්ලන්ම
(3) ළමයින් සියල්ලෝම (4) ළමයි සයල්ලෝම

(13) මුලින් දී ඇති ව්‍යාකරණ ගණයට අයත් නොවන පදය ඇති පේළිය තෝරන්න.
(1) තද්ධිත - සෙල්මුවා, පැනිත්ත, කැබිලිති, තිත්මුවා
(2) කෘදන්ත - කැවීම, පිසමන්, ලියුම, කියමන්
(3) නිපාත - මෙන්, සඳහා, සමඟ, විසින්
(4) නාම - අකුරු, පොකුරු, රුවන්, ගගන

* අංක 14-17 තෙක් දක්වෙන පද යුගලයේ දෙවන පදය පළමුවන පදය හා (1) හා (2) අර්ථයෙන් විරුද්ධද (3) පළමු වැනි පදයේ අර්ථය වැඩි කිරීමක් ද (4) වෙනස් අර්ථ දෙන්නක් ද යන්න තෝරන්න.

(14) චතුර - චතුරශ්‍ර
(1) සමාන (2) විරුද්ධ (3) වැඩි (4) වෙනස්

(15) ආධුනික - නවක
(1) සමාන (2) විරුද්ධ (3) වැඩි (4) වෙනස්

(16) පුරාතන - අද්‍යතන (පුරාතන - අද්‍යතන)
(1) සමාන (2) විරුද්ධ (3) වැඩි (4) වෙනස්

(17) අතිශය - සාතිශය
(1) සමාන (2) විරුද්ධ (3) වැඩි (4) වෙනස්

(18) මුලින් දී ඇත්තේ බහු අර්ථ දෙන පදයකි. ඒ පදයේ අර්ථයක් ඇතුළත් නොවන පදයක් ද ඇති පද පේළිය තෝරන්න.
(1) සඳ - චන්ද්‍රයා, කාලය, කල්හි, සන්ධිය
(2) දිය - ලෝකය, ජය, ගැඹුරු, ජලය
(3) වත - වක්තුව, මුහුණ, කතාව, වස්ත්‍රය
(4) සක - රෝදය, ඇස්, හක්ගෙඩිය, ශක්‍රයා

(19) පහත දක්වෙන පද පේළිය අතුරෙන් යුගල පදයක් නොවන පදයක් ද ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) පුරපති, දොස් පරොස්, තද බද, තද තෙද
(2) ඉමක් කොනක්, අබල දුබල, ජාති ජන්ම, කුල මළ

(3) හුරු පුරුදු, සුල මුල, ළඟ පාත, මහත දෙහෙත
(4) ඔප්පු තිරප්පු, උදව්පදව්, ඉවක් බවක්, ඇණුම් බැණුම්

(20) මුලින් දී ඇති ක්‍රියා ගණයට අයත් නොවන පදය ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) ප්‍රයෝජ්‍ය ක්‍රියා - පිසවයි, දුවවයි, බලවයි, නලවා
(2) විධි ක්‍රියා - දුවව, කියඟ, නමඳු, දකු
(3) ආශිර්වාද ක්‍රියා - සැරද, රැදේවා, දිනේ, ඔරැදේ
(4) පූර්ව ක්‍රියා - බලා, වැදී, කා, වපුරා

(21) තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති අර්ථය පද යෙදී ඇති අනුපිළිවෙළටම දැක්වෙන පේළිය තෝරන්න.
''**ශිෂ්‍යයෙනි**, හොඳින් ඉගෙන ගෙන **පාසලෙහි** ගෞරවය රකින්න'' යැයි **ගුරුවරු** **ශිෂ්‍යයින්** අමතා කීහ.
(1) ආලපන, කර්ම, ප්‍රථමා, ආධාර (2) ආධාර, කර්ම, ආලපන, ප්‍රථමා
(3) ආලපන, ආධාර, ප්‍රථමා, කර්ම (4) ආලපන, කර්ම, ආධාර, ප්‍රථමා

(22) නිවැරදිව සන්ධි කර ඇති අංකය තෝරන්න.
(1) සර්ම + අලංකාර = සර්වෝලංකාර (2) කෞතුකු + ආගාර = කෞතුකාගාර
(3) සහ + උදර = සහෝදර (4) දෙ + අවුරුදු = දෙයාරුදු

(23) සමාස පදයක් නොමැති වාක්‍ය ඇති පද පේළිය තෝරන්න.
(1) දරු දැරියෝ නාට්‍ය නැරඹීම සඳහා සූදානම් වී සිටියහ.
(2) සොරබියෙන් ඇළලී ගිය මිනිස්සු නැවත සන්සුන් වූහ.
(3) නියඟයෙන් දැඩි කම්පනයට පත් සිව්පාවෝ මලානිකව වැතිරි සිටිති.
(4) අම්මා නැවත එන බව අසා මම සතුටු වීමි.

(24) අකාරාදී පිළිවෙළට පද යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) සිතාරා, අමිතා, රාජිනි, ගනේෂා (2) කසුන්, ගයනී, නාලනී, ලක්ෂානි
(3) උදාරා, ආශා, සෞම්‍යා, මනීෂා (4) කෝසිලා, ජයනි, චමරි, එරන්දි

(25) සෑම පද පෙළියකම මහා ප්‍රාණක්ෂරයක් යෙදී නැති වචනය ඇති වරණය තෝරන්න.
(1) i. මන්ද බුද්ධික ii. භාග්‍යවන්ත iii. භෞතික iv. කනිෂ්ඨ
(2) i. අභිලාසය ii. ජ්‍යෙෂ්ඨ iii. ස්ථූල iv. ප්‍රාණඝාතය
(3) i. ධනේශ්වරයා ii. මිථ්‍යා දෘෂ්ටික iii. ලේඛනය iv. ගුණවන්ත
(4) i. සම්බන්ධ ii. චිරස්ථිතිය iii. විකාල භෝජනය iv. දුර්භික්ෂය

(26) අක්ෂර වින්‍යාසය අනුව වචන හතරම නිවැරදි පේළිය තෝරන්න.
(1) i. භාෂා ඥාණය ii. සම්ප්‍රදාය iii. වීරෝදාර iv. ව්‍යවස්ථාධායක
(2) i. සජ්ඣායනය ii. විශේෂණය iii. ශාස්ත්‍රය iv. ශංස්ලේෂණය
(3) i. සමස්ත ii. ප්‍රස්තාව iii. පුස්තකාලය iv. කථිකයා
(4) i. ප්‍රකාශණය ii. උෂ්ණය iii. වර්ණය iv. මන්ත්‍රණය

* අංක 27-30 තෙක් එක් එක් ප්‍රශ්නයේ ඇතුළත් වාක්‍ය අතුරින් ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.

(27) (1) සාමාජිකයෝ සියල්ලන්ම රැස්වීමට සහභාගි වූහ
(2) එදා සමහරු ගි ගයද්දී ඇතමෙකු නැටූහ
(3) මයිලණුවන් අප වෙනුවෙන් පොත් පත් මිලදී ගනිති
(4) තරඟ විභාගයෙන් බොහෝ දෙනෙකුන් පරාජය කිරීමට මම සමත් වීමි

(28) (1) විදේශිකයෝ මෙරටට එනවිට සිහලයන් රට පාලනය කළහ
(2) පාලකයන් එවැනි පියවරක් ගනිති'යි අපි කිසි විටකත් නොසිතිමු
(3) පියරජුගේ මරණයෙන් පසු ගැමුණු කුමරු රට එක්සත් කළහ
(4) කාන්තාවෝ අදහස් දක්වතොත් එය සැලකිල්ලට ගත යුතුය

(29) (1) මිනිස්සු පොත් පත් කියැවීමෙන් දැනුමත් විනෝදයත් දියුණු කරණු ලැබිය
(2) පොත් පත් කියැවීමෙන් මිනිස්සු දැනුමත් විනෝදයත් දියුණු කරයි
(3) දැනුමත් විනෝදයත් දියුණු කිරීමට මිනිසුන් පොත් පත් කියවති
(4) මිනිස්සු පොත් පත් කියැවීමෙන් දැනුමත් විනෝදයත් දියුණු කර ගනිති

(30) (1) පදික වේදිකාව නිවසය කරගත් හොරෙක් සහ අන්ධයෙක් ජීවනෝපාය වශයෙන් හිඟා කැහ
(2) පදික වේදිකාව නිවාසය කරගත් හොරෙක් සහ අන්ධයෙකු ජීවනෝපාය වශයෙන් හිඟා කැහ
(3) පදික වේදිකාව නිවාසය කරගත් හොරෙකු සහ අන්ධයෙක් ජීවනෝපාය වශයෙන් හිඟා කෑවේය
(4) පදික වේදිකාව ජීවනෝපාය කරගත් හොරෙකු සහ අන්ධයෙකු ජීවනෝපාය වශයෙන් හිඟා කෑවහ

* අංක 31 සිට 35 තෙක් මුලින් ඉදිරිපත් කර ඇති පාඨ සඳහා වඩාත් සමීප අර්ථය දෙන වරණය කුමක්ද?

(31) රෝමය එක දවසකින් ගොඩ නැගුවා නොවේ
(1) ඕනෑම දෙයක් දියුණුවට පත් වන්නේ අනුක්‍රමයෙනි.
(2) රෝමය ගොඩ නගන්න දවස් කීපයක් ගත වී ඇත.
(3) රෝමය දියුණු රාජ්‍යයක් වූයේ කල්ගත වීමෙනි.
(4) රෝමය වැනි රජ්‍යයක් ගොඩ නැගිය නොහැක.

(32) වනාන්තර කැපීම නිසා බිම දැඩි සූර්යතාපයට නිරාවරණය වේ.
(1) වනාන්තර කැපීම සූර්ය තාපයට හේතු වේ.
(2) බිම නිරාවරණය කිරීමට වනාන්තර කැපිය යුතුය.
(3) වනාන්තර කැපූ විට දැඩි හිරු රැසට පොළොව වියළී යයි.
(4) පොළවට දැඩි හිරු රැස් එන නිසා කිසි දිනක වනාන්තර නොකැපිය යුතුය.

(33) රස වින්දනය කිරීමට හෝ යහපත් විචාරයක යෙදීමට නම් බොහෝ සාහිත්‍ය නිර්මාණ කියැවීමේ පුරුද්දක් ඇති කරගත යුතුය.
(1) සාහිත්‍ය නිර්මාණ ඇසුරු කිරීම නිසා රස වින්දන කාර්යය හා විචාර කාර්යය පහසු වෙයි.
(2) සාහිත්‍ය නිර්මාණ නිසා රසවින්දනය හෝ විචාරය සැම විටම කළ නොහැකි කාර්යයකි.
(3) රස වින්දනය සහ විචාරය සඳහා කියවීමේ පුරුද්ද පමණක් ප්‍රමාණවත් නොවේ.
(4) නිර්මාණ හැකියාව වර්ධනය සඳහා විචාරයේ හා රසාස්වාදනයේ යෙදිය යුතුය.

(34) පරක් තෙරක් නැති මහ සයුර ජය ගැනීම අද මානව සංහතිය ඉදිරියේ ඇති මහත් අභියෝගයකි.
(1) මහ සයුර තරණයට මිනිස්සු අඛණ්ඩ උත්සාහයක යෙදෙති.
(2) විධිමත් ක්‍රියාමාර්ග වලින් තොරව සාගරය ජය ගත හැකිය.
(3) මහ සයුර දිනීම වර්තමානයේ බලවත් අභියෝගයක් නොවේ.
(4) සාගරයෙන් නිසි ඵල ලබා ගැනීමට බලවත් පරිශ්‍රමයක් අවශ්‍ය විය.

(35) රටක යටිතල පහසුකම්වල සංවර්ධනයක් සිදුවී තිබීම එරට සමෘද්ධිමත් භාවයේ එක් සංකේතයක් වශයෙන් සැලකිය හැකිය.
(1) රටක් සංවර්ධනය වන්නේ එරට යටිතල පහසුකම් තිබුණොත් පමණි.
(2) රටක සංවර්ධනයේ ප්‍රධාන ලක්ෂණය වනුයේ යටිතල පහසුකම් දියුණු වී තිබීමය.
(3) රටක යටිතල පහසුකම් දියුණු වී තිබීම එරට සංවර්ධනයේ ලක්ෂණයකි.
(4) යටිතල පහසුකම් දියුණු කිරීමෙන් රටක් සංවර්ධනය කළ හැකිය.

* මේ ඡේදය කියවා අංක 36 - 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.

අඳුරෙහි ඇවිදින අප කවරෙකුගේ වුවද සිතෙහි බියක් හෝ බියට හුරු අනියත හැඟීමක් පහළ වේ. මීට හේතුව කුඩා කළ අපේ සිතට වැදුණු හැඟීමක ඇති මැකී ගිය සලකුණක් පැවතීම විය හැකිය. නො එසේ නම් වැද්දන් ලෙස විසූ ආදී මනුෂ්‍යයන් තුළ පහළ වූ පැවතීම වන්නට පුළුවන්. අඳුරෙහි ඇවිදන විට ඇතිවන බිය නොහොත් අනියත හැඟීම අපට අපේ සිතින් සම්පූර්ණයෙන් අකා මකා දැමිය නොහැකිය. අපේ රටේ පරිසරය එනම් සතුන්, ගස් කොළන්, කඳු, හෙල්, ගෙවල් දොරවල් හා සිරිත් විරිත් ආදියෙහි අපටම ආවේණික ලක්ෂණ තිබේ. අපේ සිත්වල ඇඳී ඇති එම පරිසරය අපට අපේ අතීතය අනාවරණයෙන් සිහිකරවන බැවින් ඇඳුමක් පැළඳුමක් ඉවත දමන්නාක් මෙන් යට ගියාව ඉවත දමා ඉන් නිදහස් වීමට අපට නොහැකිය. වාහකයා පසු පස එන රියසක මෙන් අපේ අතීතය අප පසු පස එයි. විදේශීය සංස්කෘතියක ඇතැම් ලක්ෂණ හෝ අංගෝපාංග උකහා ගැනීමෙන් අප අපේ අතීතය බැහැර කරන බවක් හෝ අනුගාමිකයන් වන බවක් තර්කානුකූලව ඔප්පු කළ නොහැකිය. ඒ උපකරණ හෝ අංගෝපාංග අපේ සංස්කෘතියට අනුහුරු කර ගැනීම නිසා එහි මුල් මෝස්තරයට හානියක් නම් නොවන්නේය. පැරණි සංස්කෘතියක අංගයන්ට පුනර්ජීවය දීමට හෝ ඒ අංග රැක ගැනීමට බුද්ධිය මෙහෙයා කරන යමක් වොතොත් එය පැරණි දේ උචිත අන්දමින් සකස් කර ගැනීමට වහල් වන සාධකයක් ද අලුත් දේට මුහුණ පෑම නිසා හට ගන්නා හීන දින හැඟීම වෙනුවට අදින හැඟීමක් ජනනය කරන උපායක් ද වේ.

(36) වාහකයා පසුපස එන රියසක් යන කියමනෙන් ප්‍රකාශ කර ඇත්තේ
1. අතීතය වේගයෙන් අමතක වී යන බවයි.
2. බුද්ධිය පසු පස ආවේග ගමන් කරන බවයි.
3. වර්තමානය අතීතය හා අත්වැල් බැදගත් බවයි.
4. වර්තමානය ගොඩනැංවීමේදී අතීතය මුළු ගැන්වෙන බවයි.

(37) පැරණි සංස්කෘතිය රැකගැනීම සඳහා අප නිරතුරුව කළ යුත්තේ,
1. අළුත් නිමැවුම් ප්‍රතික්ෂේප කිරීමයි.
2.අතීත සොයා ගැනීම් හි අඩුපාඩු සකස් කිරීමයි.
3. පැරණි දේ අළුත් දේ සමඟ නිසි පරිදි ගැලපීමයි.
4. පැරණි නටඹුන් ආරක්ෂා කිරීමයි.

(38) මේ ඡේදයෙන් අවධාරණය වන්නේ,.
1. මිනිසා දිනෙන් දින වෙනස් වන බව කීමයි.
2. අපේ රටේ ඉතිහාසය කියා පෑමයි.
3. සංස්කෘතිය ක්‍රමයෙන් වෙනස් වන බව කීමයි.
4. විදේශ සංස්කෘතින්හි බලපෑම් යොමුවන බව කියා පෑමයි.

(39) අනාවරණයෙන් සිහිකරවයි යන්නේ අදහස වන්නේ,
1. රථයක විලාසය පෙන්වන බවයි.
2. නිරතුරු මතකයට නංවන බව යන්නයි.
3. ඉතිහාසය සිහිපත් කරවයි යන්නයි.
4. බලාපොරොත්තු නැති බව යන්නයි.

(40) අඳුරෙහි ඇවිදින විට අප තුළ බියක් ඇතිවීමට හේතුව වශයෙන් මෙහි
1. අතීතය අප තුළ පැළපැදියම් වී තිබීමයි.
2. වෘක්ෂලතා ආදිය මනසේ හොල්මන් කිරීමයි.
3. දේහිය වට පිටාවට අනුහුරු නොවීමයි.
4. විදේශිය සංස්කෘතිය අනියත බලපෑම් එල්ල කරන යවයි.

# බප/ජය. සමුද්‍රදේවි බාලිකා විද්‍යාලය - නුගේගොඩ
## පළමු වාර පරීක්ෂණය - 2012
## සිංහල භාෂාව හා සාහිත්‍යය - III කොටස

11 ශ්‍රේණිය........ | ලෙ. ..............

නම/විභාග අංකය: ....................................................................... කාලය : පැය 02 යි.

* වැදගත්: 1, 2, 3, 4 යන ප්‍රශ්න වලටත් 5, 6, 7 යන ප්‍රශ්න වලින් එකකටත් පිළිතුරු ලියන්න.

(01) i සිට x දක්වා ඇති සියලුම ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න. යම් කොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් හිස්ව තබන්න.

(i) ඔය ගජ්ජු වෙලා තිබෙන්නෙ මේ ඒයේ පෙරේදා........
(අ) මෙසේ ගජ්ජු වී ඇත්තේ කවුරුන්ද?
(ආ) මෙම පාඩම උපුටා ගත් ග්‍රන්ථය කුමක්ද?

(ii) තුලු තිලින් බත් පිඩක් නොලද්දෝ නම් මියෙත්ල
(අ) මෙහි තුලු යනුවෙන් හැඳින්වෙන්නේ කවුරුන්ද?
(ආ) මෙම පාඨය උපුටා ගත් කතා වස්තුව නම් කරන්න.

(iii) එහෙම උනත් මා නොදන්නා දෙයක් තියනවා අහන්න
දන්න කෙනෙක් සොයා බලා මට මේ ගැන කියා දෙන්න.
(අ) මෙහි සඳහන් අය නොදන්නා දේ කුමක්ද?
(ආ) මෙම කර්තෘ ගේ වෙනත් කාව්‍ය සංග්‍රහයන් 2 ක් ලියන්න.

(iv) මුන්ට ගරු කොට කියා ලඟුකොට ගොඩ නගම්
(අ) මුන් යනු කවුරුන්ද?
(ආ) මෙම ප්‍රකාශය අඩංගු ග්‍රන්ථය ලියන ලද කතුවරයා කවුද?

(v) එබැවින් මේ දානය ඕහට සපල වන සේ කෙරෙටි.
(අ) මෙසේ සිතුවේ කවුරුන්ද?
(ආ) මෙසේ සිතුවේ කුමන අවස්ථාවකදීද?

(vi) සුද්දේ උඩය කුල යුතු අය පසිද්දේ
වද්දේ විනා නොකරති ලෙඩ නොවද්දේ
(අ) මෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙම කවියේ ඇති ශබ්දාලංකාරයක් නම් කරන්න.

(vii) ඒකාත්මික මිත්‍ර පුත්‍ර කලත්‍රාදීන් හා පරිවාර ජනයන් පිරිවරා නිත්‍ය සන්තෝසයෙන් පින පිනා නොයෙක් කෙළි නළුයෙහි නියුක්තව සැපසේ වසන්නාහුය.
(අ) මෙසේ සැප ලැබුවේ කුමන ක්‍රියාවක අනුසස් වශයෙන්ද?
(ආ) මෙය සඳහන් කතාව ඇතුළත් මුල් ග්‍රන්ථය ලියූ කතුවරයා හා යුගය ලියන්න.

(viii) බොහෝ සැපක් දී ඒ ජනපදයන් ඔවුන්ටම සලස්වා බොහෝ පරිවාර සමඟ නික්මුණ.
(අ) කතාව ඇතුළත් මුල් ග්‍රන්ථය කුමක්ද?
(ආ) එම ග්‍රන්ථය ලිවීමේ පරමාර්ථය කුමක්ද?

(ix) සුදු සක ලෙසට ඇත් පැටියෙක් විත් යහනේ
සුදු සොඬ ටිකෙන් මගෙ බඩ පිරිමදිති අනේ

(අ) ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙය උපුටා ගත් මුල් ග්‍රන්ථය ලිවීමේ අරමුණු කුමක්ද?

(x) හරි පුරෝගම් කාර මිනිහෙක්.

(අ) පුරෝගම් කාර යන පදයේ තේරුම ලියන්න.
(ආ) මගුල් ප්‍රස්තාව නාට්‍යයේ ගැටුම උග්‍ර වීමට හේතු වූයේ කුමක්ද?

(02) පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨවල ඉරි ඇඳි කොටස්වල අර්ථය වෙනම ලියන්න. ඉන්පසු මුළු කොටසේම අර්ථය ලිහිල් බසින් ලියන්න.

(i) මිය පරලොව යන කළ කුසල් ගෙන යන මුත් යටත් පිරිසෙයින් කොකුමස්සක් විතරක් ගෙන යන්නේ නැත.

(ii) අතක් බෝසතුගෙ ළෙයි තබමින් විමසා
මදක් සැලි සැලි පණනළ තිබෙන නිසා
පසක් තෙදුති දෙවියන් යදිමින් නොලසා
නැතත් කන්නලව් බස් තෙපලයි මෙලෙසා

(iii) තෙල් පතක් වැළැන්දා සේ සර්වාංගයෙහි ධමනි පෙනෙන්නට පටන් ගත. එපවත් අසා දඹදිව බොහෝ වෛද්‍යවරු අවුත් අවස්ථා නොදන විස්මය ප්‍රතිකාර කොට සමනයක් කොට ගත නොහී යන්නාහුමය.

(iv) ඒ කුමාරයන් මවු කුසින් බිහිව ක්‍රමයෙන් වැඩී ශික්ෂා ග්‍රහණ කාලය සම්ප්‍රාප්ත විය. එකලැ මේ ලංකා ද්වීපයෙහි මනුෂ්‍යයෝ පස් හැවිරිදි කුමාර වරුන් තම තමන් විභාවානුරූපව නොයෙක් ආභරණයෙන් සරහා මහත් වූ මඟුලෙන් ශික්ෂාග්‍රහණය කරවති.

(03) පියසේන ඇසූ ප්‍රශ්නයක් පද්‍ය පන්තිය

(i) ඉගෙනීමට දැඩි ආශාවක් දක්වන දරුවකුගේ සිතුවිලි
(ii) එම අත්දැකීම ඉදිරිපත් කිරීමට කාව්‍ය උපක්‍රම සාර්ථක ලෙස යොදා ගැනීම.

නිදසුන් දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

නැතහොත්

කිඳුරු වලප පද්‍ය පන්තිය තුළින්

(i) කිඳුරු යුවල සාර්ථක යුග දිවියක් ගත කළ බවට
(ii) කිඳුරා ගේ හදිසි වියෝවෙන් ඇතිවූ කම්පනය මැනවින් විදහා දක්වයි. එක් කරුණකට නිදසුන් 2 බැගින් දක්වමින් ලියන්න.

(04) උක්තරෝලිය කතා වස්තුවෙන් කියැවෙන්නේ

(i) යමක් ලැබිය යුත්තේ සුදුසුසාටමය යන දහම තහවුරු කිරීම හා
(ii) කුසල් රැස් කිරීමෙන් ලැබෙන ආනිශංස පිළිබඳවය. එක් කරුණකට උදාහරණ 2 බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

හක්ත හක්තික සිටාණන්ගේ කතාව සාර්ථක වී ඇත්තේ,

(i) උචිත රචනෝපක්‍රම යොදා ගැනීම.
(ii) උචිත අවස්ථා පමණක් තෝරා ගැනීම යන කරුණු කෙරෙහි ලේඛකයා දැක්වූ කුසලතාව නිසාය. එක් කරුණකට නිදසුන් 2 බැගින් දක්වමින් ඉහත අදහස් පැහැදිලි කරන්න.

* 5, 6, 7 යන ප්‍රශ්න වලින් එකකට පමණක් පිළිතුරු ලියන්න.

(05) උත්ත රෝලිස් කතා වස්තුවෙන් පැරණි ලංකාවේ පැවති සමාජ ආර්ථික තොරතුරු රැසක් හෙළිවේ. උදාහරණ 3 ක් දෙමින් පැහැදිලි කරන්න.

(06) "තක්සලා නුවර දිසාපාමොක් ඇඳුරු තුමා ගුරු භූමිකාව මැනවින් අවබෝධ කර ගත්තෙකි" උදාහරණ තුනක් දක්වමින් පැහැදිලි කරන්න.

(07) මිනිස් සන්තානය තුළ පවත්නා පොදු මිනිස් දුර්වලතා උපහාසයෙන් යුතුව ඉදිරිපත් කිරීම මගුල් ප්‍රස්තාව නාට්‍යයේ මුඛ්‍ය පරමාර්ථය වී ඇත. නාට්‍යයේ පෙළ ඇසුරින් උදාහරණ තුනක් දක්වමින් විස්තර කරන්න.